# බලහත්කාර ශ්‍රමය



## මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව


කේ.කේ.ඞී.කේ.එස්.සෝමරත්න

සංවර්ධන නිලධාරි

# බලහත්කාර ශ්‍රමය

ලෝක සැපයුම් දාමයට රැකියා, කුසලතා සංවර්ධන හා තාක්ෂණය සතුය. නැතහොත් ළමා ශ්‍රමය, මානව හිමිකම් උල්ලංගනය, බලහත්කාර සේවයේ යෙදවීම හා මිනිස් ජාවාරම් ලෝක සැපයුම් දාමය හා සම්බන්ධය. මෙම ක්ෂේත්‍රවල සියලු ක්‍රියාකාරිකයින් මෙම මානව හිමිකම් උල්ලංගනය වැලක්වීමට වගකීම් සහගතව ක්‍රියාකරනු ඇතැයි බලාපොරොත්තුවයි. බලහත්කාර සේවයේ යෙදවීම යනු 1930 (අංක 29) ජාත්‍යන්තර කම්කරු ගිවිසුමට අනුව සළකන ලද පුද්ගලයකු සිය කැමැත්තෙන් තොරව හිරිහැර හා දඬුවම් යටතේ ලබාගන්නා වැඩ හෝ සේවාවන් ය.

ලෝක ප්‍රජාව ධරණීය සංවර්ධන ඉලක්ක සඳහා සම්මත කරමින් 2025 දී ළමා ශ්‍රමය අවසන් කිරීමටත්, වසර 2030 වන විට බලහත්කාරයෙන් සේවයේ යෙදවීම අවසන් කිරීමටත් එකඟ වී ඇත. නවතම ලෝක පුරෝකථනයන්ට අනුව මිලියන 152 ළමයින්, ළමා ශ්‍රමයේද, වැඩිහිටියන් හා ළමයින් මිලියන 25ක් බලහත්කාර සේවයේද යෙදී සිටිති. ධරණීය සංවර්ධන ඉලක්ක 8.7ලඟාකර ගැනීමට මූල්‍ය ක්ෂේත්‍රය ,රජයන් ව්‍යාපාර හා සිවිල් සමාජය ඉතා දැඩි පියවර ගෙන මානව හිමිකම් උල්ලංගනය මැඩලීම සිදුකල යුතුය.

බලහත්කාර සේවයේ යෙදවීම කොවිඩ් 19 වසංගතය නිසා සමාජ ආර්ථික අවදානම වැඩිවීමත් සමගම ඉහල ගොස් ඇත. අවිධිමත් අංශයේ සේවයේ යෙදෙන්නන් මූල්‍ය සේවා වෙත ඇති දුරස්ථභාවය නිසාත්, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වෙත වෙන කවරදාටත් වඩා දැනෙන පීඩනය හා ප්‍රජා සහභාගීත්ව ඉතිරි කිරීම් ක්‍රම වැසී යාමත් සමග සේවකයන් අධි අවදානම් ණය ගැනීම් ආදිය නිසා බලහත්කාරයෙන් සේවයේ යෙදවීමකට ලක්විය හැක. උදාහරණයක් ලෙස කාම්බෝජයේ ඇ.ඩො. බිලියන 10 ක් ක්ෂුද්‍ර මූල්‍ය ණය පවතී. ඉන්දියාවේ විගමණික සේවකයන් 3000ක් ඇසුරින් කෙරුනු අධ්‍යයනයකින් හෙළිවී ඇත්තේ ඉන් 1/4 ක් පමණ ණය කරුවන් වී ඇති බවයි. ඔවුන් ණය හිමියන් ගේ විවිධ තාඩන පීඩන වලට ලක් වෙමින් සිටි(Issue Paper on Covid-19 and fundamental Principles and Rights of work). විශ්වාසදායී දත්ත නැතත් ලෝකයේ විවිධ පැතිවලින් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් වැඩ ලෝකය තුළ බලහත්කාරයෙන් සේවයේ යෙදවීමට හෝ ජාවාරම් වලට සම්බන්ධ වීම් බහුලව සිදුවන බව ලෝකයේ නන් දෙසින් අසන්නට ලැබේ. විශේෂයෙන්ම මගී හුවමාරු මධ්‍යස්ථාන වල සිරවී සිටින, දේශසීමා අතර කඳවුරුවල සිරවී සිටින දසදහස් ගණන් සේවකයන් ඇත.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයහි ඇස්තමේන්තුවලට අනුව ලොවපුරා මිලියන 37 ක් සිය රැකියාව හෝ ආදායම් මාර්ගය අහිමි විමේ අවදානමකට ලක්වී ඇත්තේ විධිමත් සමාජ ආරක්ෂණ ක්‍රම වලට අනුගත නොවී ඇති අයයි.

කොවිඩ් 19 වසංගතය නිසා වැටුනු ආර්ථිකය පනගැන්වෙන විට බලහත්කාරයෙන් නැවත සේවය ලබා ගැනීම සිදුවේ. සමහර මානව හිමිකම් සංවිධාන වලින් නිකුත් කරන ලද වාර්තා වලින් දක්වන පරිදි ලොව පුරා ඇති වෛද්‍ය උපකරණ සහ සැපයීම් සමාගම් සිය ඉල්ලුම සපුරා ගැනීමට බලහත්කාර


සේවය ලබා ගැනීමට පෙළඹී ඇත. දේශීයව සිය අවශ්‍යතාවයන් සපුරා ගැනීමට, ශ්‍රම සූරා කෑමට ලක්විය හැකි සිරකරුවන් වැනි අවදානම් කණ්ඩායම් වල සේවය ලබාගැනීමට සමහර සීමා කිරීම් හා නීතිරීති බාධාවන් ඉවත් කිරීමට උත්සහ දරයි. වඩා පැහැදිලිව කිවහොත් අවදානම් සමාගම් මූල්‍ය අපහසුතා ජය ගැනීමට සිය ශ්‍රම සම්මතයන් ලිහිල් කරමින් බලහත්කාර සේවය ලබා ගත හැකි අවිධිමත් අංශය වෙත මාරුවීමට පුළුවන. දැනට ඇති ඇස්තමේන්තුවලට අනුව ඉන්දියාවේ සමහර කුල හා ගෝත්‍රයන්ට අයත් ජනයා බලහත්කාර ශ්‍රමය ලබාගැනීමට ලක්වී ඇත. එසේම බටහිර නේපාලයේ දේශීය සුළු ජාතීන්, පකිස්ථානයේ සමහර මුස්ලිම් නොවන ජාතීන් මෙම බලහත් කාර ශ්‍රමයට ලක්වී ඇත.

ලෝකයේ සමහර ස්ථානවල සේවය අවසන් කල විගමණික සේවකයන්ගේ විසා කාලය අවසන් වීම හෝ බලපත්‍ර කාලය අවසන් වීම නිසා අක්‍රමවත් බවක් දක්නට ලැබේ. සමහර දෙනෙක් වැඩක නිරත නොවීමෙන්ම සිය රට වලට යාමට සිදුවීම නිසා ඇතිවන අපකීර්තියට අමතරව නිරෝධායන නීති වලට යටත් වීමට ද සිදුවේ. අනෙක් අතට විදෙස් රැකියා සඳහා අයදුම් පත් යොමුකර විශාල වශයෙන් බඳවා ගැනීම් ගාස්තු වැයකර අක්‍රමවත් විගමණිකයන් සිදුකර ණය බැඳුම්කර වලට හසුවීමට හැක.


තවත් විශේෂිත කණ්ඩායමක් නම් ගෘහස්ත සේවකයන් වේ. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ පුරෝකථනයන්ට අනුව මොවුන් මිලියන 55ක් මුළු ලෝකයේම සිටී. ඔවුන්ගෙන් 3/4 ක් එනම් මිලියන 37 කට වඩා ගැහැණුන් වේ.මේ අය සියල්ලම විධිමත් සමාජ ආරක්ෂණ ක්‍රම වේදයකට අනුගත නොවීම නිසා සිය ආදායම් හා රැකියාවන් අහිමි වීමේ අවදානමකට ලක්වී ඇත. මානව හිමිකම් සංවිධාන විසින් දැනුම් දී ඇත්තේ ගෘහස්ථ සේවකයින් ට එරෙහිව භෞතික හා ලිංගික ප්‍රචණ්ඩත්වය වැඩිවන බවයි. එසේම නවාතැන් අහිමි භාවය හා තම රැකියා අහිමි වීම නිසා සියරටවල් වලට යෑමට නොහැකිවන තත්ත්වයන්ට ද ඔවුන් මුහුණ දී ඇත.

කොවිඩ් 19 නිසා ඇතිවූ ආර්ථිකයේ කැළඹීම නිසා බලහත්කාර ශ්‍රමය ලබාගැනීමට ඉඩ ප්‍රස්ථාව නිර්මාණයවී ඇත. හදිසි තත්ත්වය කළමනාකරණය කිරීමට ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රය ලක්වී ඇති පසුබිමක කෘෂිකර්මාන්තයද බලහත්කාර ශ්‍රමය ලබාගන්නා ක්ෂේත්‍රයක් වී ඇත.


මූල්‍ය බැඳීම් පවතින සමහර ආයතන සිය කම්කරු සම්මත නීතීන් ලිහිල් කර අවිධිමත් ආර්ථික තත්ත්වයකට පත්වීමට ඉඩ ඇත. එනිසා බලහත්කාර ශ්‍රමය, ආර්ථිකය නැවත විවෘත වීමේදී ඇතිවේදැයි සොයා බැලීමට සියළුම ව්‍යාපාරයන් ඇගයීමට ලක්කල යුතුය[2].




මූලාශ්‍රය:ILO - Global Estimate of Forced Labour Results and Methodology - (Page-15 )-2012




මූලාශ්‍රය: ILO - Global Estimate of Forced Labour Results and Methodology - (Page-15) - 2012




මූලාශ්‍රය: ILO - Global Estimate of Forced Labour Results and Methodology - (Page 37)-2012

අධ්‍යයනයන් මගින් හෙලිවි ඇති කරුණු අනුව, අඩු කුසලතා හා නුපුහුණු ශ්‍රමිකයින් බලහත්කාර ශ්‍රමයට ලක්වන බවයි. මෙහිදී දැක්විය හැකි ක්ෂේත්‍රයන් නම් කෘෂිකර්ම, ධීවර හා වන සම්පත්, ඉදිකිරීම්, නිෂ්පාදන, පතල්, පොදු පහසුකම් හා ගෘහාශ්‍රිත වැඩ වල බවයි. සාක්ෂරතාවය නැතිකම හා අඩු අධ්‍යාපනය බලහත්කාර ශ්‍රමයට ප්‍රධාන සාධක වී ඇත. අඩු අධ්‍යාපනයක් ඇති වැඩිහිටියන් හා අඩු අධ්‍යාපනයක් ඇති දෙමව්පියන්ගේ ළමයින් අධි අවදානම් කණ්ඩායම් වේ. සාක්ෂරතාවය හා අධ්‍යාපනය අඩුවනවිට රැකියා අවස්ථා හිඟවන අතර අඩු පහසුකම් යටතේ වැඩකිරීමට පෙළඹේ.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ගෝලීය ඇස්තමේන්තු අනුව බලහත්කාර ශ්‍රමයට ලක්වන්නන් ගෙන් 55% කාන්තාවන් හා ගැහැණු ළමයින්ය. තවත් රටවල කර ඇති සමීක්ෂණයන් ගෙන් හෙලිවී ඇත්තේ ගැහැණු ගෘහ මූලික පවුල් , පිරිමි ගෘහ මූලික පවුල්වලට වලට වඩා වැඩි අවදානමක් දරණ බවයි. මේ අනුව ස්ත්‍රී පුරුෂ භාවය බලහත්කාර ශ්‍රමය ලබාගැනීම තීරණය කිරීමේ ප්‍රධාන සාධකයක් බව පෙනී යයි[3] .

ආශ්‍රිත ග්‍රන්ථ


1. ILO Global Estimate of Forced Labour Results and Methodology. (Page 11-48), Retrieved from,
https://www.ilo.org/global/topics/forced-labour/publications/WCMS_182004/lang--en/index.htm

2. Issue Paper on Covid-19 and fundamental Principles and Rights of work (Page 5-14)
https://www.ilo.org/global/about-the-ilo/how-the-ilo-works/departments-and-offices/governance/fprw/WCMS_757247/lang--en/index.htm

3. Profits and Poverty the Economics of Forced Labour - (Page - 6,7)
https://www.ilo.org/global/topics/forced-labour/publications/WCMS_243027/lang--en/index.htm